කොස් /දෙල් ගස් හෙළීම් බලපත්‍රයක් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛන

1) හෙළීම් බල පත්‍රයක් ඉල්ලුම් කිරීමේ අයදුම්පත

2) ගස හෙළීමේ අවශ්‍යතාවය ඇතුලත් ඉල්ලීම් ලිපිය (ග්‍රාම නිලධාරි මඟින් නිර්දේශ කරන ලද)

3) ගස පිහිටි ඉඩමේ ඔප්පුවේ පිටපතක් (ග්‍රාම නිලධාරී විසින් සහතික කරන ලද)

4) ගස පිහිටි ඉඩමේ සැලැස්මෙහි පිටපතක් (ග්‍රාම නිලධාරි විසින් සහතික කරන ලද)

- නොබෙදූ ඉඩමක් නම්, ප්‍රාණ භක්තියට යටත්ව අයිතිය හිමිවේ නම්, අනෙක් සියලුම පාර්ශවකරුවන්ගෙන් ගස හෙළීමට කැමැත්ත ප්‍රකාශිත ලිපි (ප්‍රකාශ කර පදිංචි වසමේ ග්‍රාම නිලධාරි විසින් සහතික කර ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කරන ලද) ඉදිරිපත් කළ යුතුය.

- ඉඩමේ හිමිකරු මිය ගොස් ඇත්නම්, ඉල්ලුම්කරුට ඉඩමේ අයිතිය සනාථ කිරීම සඳහා අදාල ලේඛනයන්හි සහතික කරන ලද පිටපත් (උදා. උප්පැන්න සහතික, විවාහ සහතික, මරණ සහතික ...) ඉදිරිපත් කළ යුතුය.

- ලේඛන වල සඳහන් නම් වල පරස්පරතාවයක් ඇත්නම් නිවැරදි නම සනාථ කිරීමට දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය.

- ඉඩමේ හිමිකරුට හෝ ඔහුගේ / ඇයගේ දරුවකුට නිවසක් ඉදිකිරීමේ දී අවශ්‍ය දැව සපයා ගැනීම සඳහා ගසක් හෙළීමට නම්, අදාල අධිකාරිය විසින් අනුමත කළ ඉදිකිරීම් සැලැස්මෙහි සහතික කරන ලද පිටපතක් ඉදිරිපත් කළ යුතුය.

- එසේම නිවස ඉදිකරන බවට අදාල ග්‍රාම නිලධාරී විසින් නිර්දේශ කරන ලද ලිපියක් ක්ද ඉදිරිපත් කළ යුතුය (නිවස ඉදිකරනුයේ මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් පිටත ප්‍රදේශයක නම් එම ලිපිය අදාල කොට්ඨාශයේ ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කර ඉදිරිපත් කළ යුතුය.)

- ගොඩනැගිල්ලක ඉදිකිරීමේදී, ඉදිකිරීම් කාර්යයට බාධාවක්ව පවතින ගසක් හෙළීමට නම්, අදාල අධිකාරිය විසින් අනුමත කළ ඉදිකිරීම් සැලැස්මෙහි සහතික කරන ලද පිටපතක් ඉදිරිපත් කළ යුතුය.

- නොබෙදූ ඔප්පුවකින් ලද නමුත් තමන්ට හිමි ඉඩම් කොටස වැට මායිම් යොදා නිරවුල්ව දීර්ඝ කාලයක් භුක්ති විඳින අවස්ථාවක දී.

ඔප්පුවක් නොමැති වුවද එකී ඉඩම් කොටස වැට මායිම් යොදා නිරවුල්ව දීර්ඝ කාලයක් භුක්ති විඳින අවස්ථාවක දී,

දීර්ඝ කාලයක් ඉඩම් භුක්ති විඳ ඇති බවටත් වෙනත් හවුල් කරුවන් නොමැති බවටත්. ගසෙහි/ ගස්හී අයිතිය සම්බන්ධයෙන් වෙනත් පාර්ශවයකින් ගැටළුවක් ඇති වුවහොත් ඒ සම්බන්ධයෙන් තමා වගකීම භාර ගන්නා බවටත්, කිසියම් හේතුවක් මත ගසෙහි/ගස්හි වටිනාකමට තක්සේරුගත මුදල අධිකරණය වෙත ගෙවීමට සිදු වුවහොත් එයට එකඟ වන බවත් තහවුරු කරන ලද දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය.